# පරිසර අමාත්‍යාංශය

## දේශගුණික විපර්යාසවල තීව්‍ර වන බලපෑම මගින් අවදානමට ලක්විය හැකි ශ්‍රී ලංකාවේ ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම (ADAPT4R) ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවා ගැනීම

ඉහත ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ දේශගුණික විපර්යාස අනුවර්තන ධාරිතාව සහ ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීමයි. මෙම ව්‍යාපෘතිය මගින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට අවසන් ග්‍රාහකයා දක්වා දේශගුණ සේවා (LMCSs) භාවිතයට ප්‍රවේශය ශක්තිමත් කිරීමට හැකියාව ලැබෙනු ඇති අතර, එමගින් සකස් කරන ලද කෘෂි කාලගුණික ක්‍රම පද්ධති සාමූහිකව සංවර්ධන කිරීම, ඒවා බෙදා හැරීම, එලෙස සකසන ලද කෘෂි කාලගුණික හා ජල කාලගුණික උපදේශන සේවා උඩුපරිමාණය කිරීම (scale up) සහ ඉහළ දේශගුණික අවදානම් තත්ත්වයන්ට මුහුණ දෙන දිළිඳු ගොවි පවුල්වල දරාගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සමග කාන්තාවන් සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරමින්, දේශගුණික උපදේශන මගින් දැනුම් දෙන ලද දේශීය අනුවර්තන සැලසුම් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට හැකිවන අතර, එමගින් වැඩිදියුණු කළ භාවිතයන් සහ විවිධාංගීකරණය වූ දේශගුණික ප්‍රතිරෝධී ජීවනෝපායන් ඇති වේ.

පරිසර අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර, ලෝක ආහාර වැඩසටහන (WFP) මෙම ව්‍යාපෘතියේ බහුපාර්ශ්වික ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ. මෙම ව්‍යාපෘතිය ජාතික සහ අතුරු ජාතික මට්ටමින් බහු පාර්ශ්වකාර සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියාත්මක වේ. ව්‍යාපෘති ප්‍රදාන මුදල එක්සත් ජනපද ඩොලර් 6,997,762 ක් වන අතර, ව්‍යාපෘති කාලය 2025 සිට 2029 දක්වා වසර 5 කි. මෙම ව්‍යාපෘතිය මොනරාගල, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මන්නාරම, මුලතිවු සහ වවුනියාව දිස්ත්‍රික්කයන් හි ක්‍රියාක්මක වේ.

පරිසර අමාත්‍යාංශය විසින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව ඉහත ව්‍යාපෘතියෙහි කොළඹ, ජාතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම (NPET) සහ දිස්ත්‍රික්ක 6 ක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIUs) සඳහා ව්‍යාපෘති කාර්යමණ්ඩල බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳනු ලැබේ.

පහත සඳහන් තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | තනතුරු ගණන | පූර්ණ කාලීන / අර්ධ කාලීන | වැටුප් පරිමාව |
|---|---|---|---|---|
| 01 | ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක | 01 | පූර්ණ කාලීන | PS 1 |
| 02 | මූල්‍ය කළමනාකරු | 01 | පූර්ණ කාලීන | PS 3 |
| 03 | ව්‍යාපෘති අධීක්ෂණ සහ වාර්තාකරන කළමනාකරු | 01 | පූර්ණ කාලීන | PS 3 |
| 04 | දිස්ත්‍රික් ක්‍රියාත්මක කිරීමේ කළමනාකරුවන් | 06 | පූර්ණ කාලීන | PS 3 |

### 01. ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක - තනතුරු 01 - කොළඹ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ වන ක්ෂේත්‍රයක (කෘෂිකර්මය, පරිසර කළමනාකරණය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, ඉංජිනේරු, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, කළමනාකරණ ආදිය) ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ වන ක්ෂේත්‍රයක මූලික උපාධියට සමාන සුදුසුකමක්

**සමග**

- අදාළ ක්ෂේත්‍රයේ (කෘෂිකර්ම, පරිසර කළමනාකරණ, ව්‍යාපෘති කළමනාකරණ, දේශගුණ විපර්යාස, රාජ්‍ය පරිපාලනය) පශ්චාත් උපාධි සුදුසුකමක් (මාස්ටර්ස් උපාධිය / පශ්චාත් උපාධිය)

**සහ**

- අදාළ ක්ෂේත්‍රයේ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද
- විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතියක කළමනාකරණ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වේ.

### 02. මූල්‍ය කළමනාකරු - තනතුරු 01 - කොළඹ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ වන ක්ෂේත්‍රයක (මූල්‍ය, වාණිජ, කළමනාකරණය සහ ගිණුම්කරණය) ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

**හෝ**

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක්

**සහ**

- අදාළ ක්ෂේත්‍රයේ රජයේ දීපව්‍යාප්ත සේවයේ III/II පංතියේ හෝ ඉහළ හෝ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම

**හෝ**

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක්

**සමග**

- අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5 ක පළපුරුද්ද
- විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතියක කළමනාකරණ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වේ.

### 03. ව්‍යාපෘති අධීක්ෂණ සහ වාර්තාකරණ කළමනාකරු - තනතුරු 01 - කොළඹ

- අදාළ ක්ෂේත්‍රයේ (පරිසරය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය) හෝ සම්බන්ධ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය

**සහ**

- අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (මාස්ටර්ස් උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමා)
- ප්‍රගතිය වාර්තා කිරීම, අධීක්ෂණය සහ ඇගයීම, දත්ත පදනම් කළමනාකරණය පිළිබඳව අවම වශයෙන් වසර 5 ක පළපුරුද්ද
- ජාත්‍යන්තර ආධාර නියෝජිතායතන සහ / හෝ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන හි සම්බන්ධීකරණය පිළිබඳ පළපුරුද්ද.
- ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම පිළිබඳ සහතිකයක් හෝ ඩිප්ලෝමාවක් දැරීම අතිරේක සුදුසුකමක් වේ.

### 04. දිස්ත්‍රික් ක්‍රියාත්මක කිරීමේ කළමනාකරුවන් - කුරුණෑගල, මොනරාගල, මන්නාරම, මුලතිවු, ත්‍රිකුණාමලය සහ වවුනියාව

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ වන ක්ෂේත්‍රයක (කෘෂිකර්මය, පරිසර කළමනාකරණය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, භූගෝලය ආදිය) ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**හෝ**

- අදාළ ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියට සමාන සුදුසුකමක්

**සමග**

- පරිසරය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක අවම වසර 5 ක පළපුරුද්ද
- ශක්තිමත් පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය, සන්නිවේදන කුසලතා සහ කාණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව අත්‍යවශ්‍ය වේ.

**පොදු කොන්දේසි :**

- **තෝරාගැනීමේ ක්‍රමවේදය :** සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම් කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.
- **වයස :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව වේ.
- **සේවා නියුක්තියේ නියමයන් :** සියලුම බඳවා ගැනීම් කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා වන අතර, කාර්යය සාධනය මත පදනම්ව දීර්ඝ කරනු ඇත.
- ඉහත තනතුරු පිළිබඳ යොමු නියමයන් (TOR) සහ මූලික අයදුම්පත් ආකෘතිය www.climatechange.lk සහ www.env.gov.lk යන වෙබ් අඩවි වෙතින් බාගත කරගත හැක.

ඉහත තනතුරු සඳහා යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජීව දත්ත පත්‍රිකාවක් සමග **අධ්‍යක්ෂ, දේශගුණික විපර්යාස කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, "සොබාදම් පියස", 416/C/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල** යන ලිපිනය වෙත 2025.05.14 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල මගින් එවන මෙන් පරිසර අමාත්‍යාංශය සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

ප්‍රමාදවී කෙරෙන ඉදිරිපත් කිරීම් පිළිනොගැනේ.

**ලේකම්,**
**පරිසර අමාත්‍යාංශය, බත්තරමුල්ල.**